# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2423/35 - 2025 පෙබරවාරි මස 15 වැනි සෙනසුරාදා - 2025.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

MOD/DEF/HRM/01/AMD/REG.

එල්.ඩී.-බී 16/2016.

**නාවික හමුදා පනත**

(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ආරක්ෂක අමාත්‍ය.

2025 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1993 දෙසැම්බර් මස 27 වැනි දින අංක 799/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද 1989 ශ්‍රී ලංකා නාවික හමුදා කාන්තා සේවා නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 16 වන නියෝගයෙහි -

(අ) (ඇ) ඡේදයෙහි "වයස අවුරුදු හතළිස් පහේ දී" යන වචන වෙනුවට "වයස අවුරුදු පනස් පහේ දී (55)" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්,

"(ඉ) සේවයෙන් විශ්‍රාම ගන්නා අධිකාරි ලත් නිලධාරිනියක්, ඇයට වයස අවුරුදු හැට (60) එළඹෙන තෙක් හෝ නාවික හමුදාපති විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ ඊට කෙටි කාලයක්, ස්ථිර උපසේවයට මාරු කරනු ලැබිය හැකි ය.".



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 29 වන නියෝගයෙහි -

(අ) (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) කාන්තා නැවියෙක් මූලික වශයෙන් බඳවා ගැනීමේ කාලසීමාව වසර පහළොවකට (15) නොවැඩි විය යුතු අතර, ඉන්පසුව ඇය සේවයෙන් නිදහස් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් කාන්තා නැවියකු විශේෂ වෘත්තියකට බඳවා ගනු ලැබ ඇති අවස්ථාවක දී හෝ එම කාන්තා නැවියාට යම් විශේෂිත පුහුණුවක් ලබා දී ඇති අවස්ථාවක දී, එම කාන්තා නැවියාගේ විශ්‍රාම ගැනීම නාවික හමුදාවේ යහපතට හානිදායක බව නාවික හමුදාපතිගේ මතය වන්නේ නම් ඇයට සේවා කාලය වසර පහළොව සම්පූර්ණ වීමේ දී විශ්‍රාම යාමට ඉඩ නොදෙනු ලැබිය හැකි ය.".

(ආ) (ආ) ඡේදයෙහි "අවුරුදු 20 කට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවුරුදු විසිදෙකකට (22)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) (ඇ) ඡේදයෙහි "අවුරුදු 20ක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවුරුදු විසිදෙකක් (22)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එහි 37 වන නියෝගය ඉවත් කිරීමෙන්.

EOG 02 - 0134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.